# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.03.09 පැය 0720 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/416/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. අත්අඩංගුවට ගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකුගෙන් අපරාධ රැසක් අනාවරණය වීම - බස්නාහිර පළාත දකුණු දිසා අපරාධ කොට්ඨාසය.**

2026.03.02 වන දින බස්නාහිර පළාත දකුණු දිසා අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කන්ඩායමක් විසින් අයිස් මත්ද්‍රව්‍ය සන්තකයේ තබාගැනීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන සිටි වයස අවුරුදු 28 ක් හා 42 ක් වන පන්නිපිටිය හා හෙට්ටිපොල ප්‍රදේශවල පදිංචි සැකකරුවන් දෙදෙනෙකුට වැඩිදුර විමර්ශන සඳහා දින 07ක් රැඳවුම් නියෝග ලබා ගෙන තිබුණි.

සැකකරුවන් සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී මොවුන් හෝමාගම, කොට්ටාව, මහරගම හා වැල්ලම්පිටිය පොලිස් වසම් වල රාත්‍රී කාලයේ වෙළඳසැල් බිඳ මුදල් හා දේපොල සොරකම් කිරීමේ අපරාධ රැසකට අවශ්‍ය කර සිටි සැකකරුවන් දෙදෙනෙකු බවට අනාවරණය වී ඇත.

එම සැකකරුවන්ගෙන් අනාවරණය වූ තොරතුරු මත 2026.03.08 වන දින උදෑසන කාලයේ හෝමාගම පොලිස් වසමේදී ඉහත අපරාධ වලට සම්බන්ධ තවත් සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 මිලිග්‍රෑම් 300ක් සමඟ විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන දෙල්දූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු බොරැල්ල පොලිස් වසමේ රාත්‍රී කාලයේ වෙළඳසැලක් බිඳ මුදල් හා දේපල සොරකම් කිරීමේ අපරාධයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු බවට අනාවරණය වී ඇත.

සැකකරුවන් විසින් සොරකම් කරන ලද පරිගණක, ජංගම දුරකතන ඇතුලු විද්‍යුත් උපකරණ, වාහන බැටරි හා වාහන අමතර කොටස් ගැලවීම සඳහා භාවිතා කරනු ලැබූ යතුරු කට්ටලයක් පොලිස් භාරයට ගෙන ඇත.

සැකකරුවන් 2026.03.09 වන අද දින හෝමාගම ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. බස්නාහිර පළාත දකුණු දිසා අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. එනසාල් හා විදේශීය මත්පැන් නීති විරෝධී ලෙස මෙරටට රැගෙන ආ විදේශිකයින් දෙදෙනෙකු අත්අඩංගුවට - ගුවන්තොටුපල පොලිස් ස්ථානය.**

2026.03.08 දින රාත්‍රී කාලයේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ පැමිණීමේ පර්යන්තයේදී ගුවන්තොටුපල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද **එනසාල් කිලෝග්‍රෑම් 60 ක් හා විදේශීය මත්පැන් බෝතල් 41 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 31 හා 45 වයස්වල පසුවන ඉන්දියානු ජාතිකයින් වේ.**

සැකකරුවන් වැඩිදුර විමර්ශන සඳහා ගුවන්තොටුපල රේගු නිලධාරීන් වෙත භාර දීමට නියමිතය.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**